විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2013 දිනය / திகதி / Date 2013-04-18

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/ 2013**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම පළාත් පාලන බලමණ්ඩල වල ප්‍රධානීන්.

## විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවා කාලයට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම

"විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීමේ නව ක්‍රමය" යන මැයෙන් නිකුත් කරන ලද 2004-08-30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/ 2004 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ (2) ජේදයට අනුව විශ්‍රාම වැටුප් ගණනය සඳහා ගණන් ගත හැකි සම්පූර්ණ දළ සේවා කාලය තුළ ගැනෙන අනියම්, ආදේශක, තාවකාලික, පුහුණු යනාදී වශයෙන් වූ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගනු ලබන සේවා කාල සඳහා වැන්දඹු අනත්දරු දායක මුදල් අයකළ යුතුය.

03. දායක මුදල් අයකිරීම 2008-01-30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/ 2008 ප්‍රකාරව නිලධාරියාගේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරේ ආරම්භක වැටුප පදනම් කරගෙන සිදුකළ යුතුය. එම මුදල දායකයාගේ මනාපය පරිදි මුදල් මඟින් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගත හැකිය. විශ්‍රාම වැටුප් අයදුම්පත් මා වෙත යොමු කිරීමේදී මෙසේ ගණනය කරන ලද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් වගබලාගත යුතු අතර, එවැනි අයකිරීම් අතපසු නොකිරීම ආයතන ප්‍රධානියා සතු වගකීමක් වන බවද දන්වා සිටිමි.

04. එහෙත් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/ 2004 හි 2.6 ජේදය සම්බන්ධයෙන් මෙම කොන්දේසි අදාළ නොවේ.

ඩී. ස්වර්ණපාල
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
04. විගණකාධිපති.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk